කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2015

2021 - මාර්තු /අප්‍රේල්

BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 04

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්ණ අංක 01

අ. කළමනාකරණ ගිණුම්කරණයට සාපේක්ෂව මූල්‍ය ගිණුම්කරණය යන්න පැහැදිලි කරන්න

(ලකුණු 06)

ආ මූල්‍ය ගිණුම්කරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ. මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන පාර්ශවකරුවන් පස් දෙනෙකු හඳුනාගන්න.

(ලකුණු 05)

ඉ. මෙවන්ගේ ව්‍යාපාරයෙහි පහත ගනුදෙනු ඇත. එම එක් එක් ගනුදෙනුව පුළුල් කළ ගිණුම්කරණ සමීකරණයේ සටහන් වන්නේ කෙසේදැයි හඳුනා ගන්න.

i. ප්‍රාග්ධනය රු. 50,000,000 ක් ආයෝජනය කර ඇත.

ii. ව්‍යාපාරයට රු. 5,100,000 ක ණයක් ලබා දී ඇත.

iii. ගෙවූ බැංකු පොළිය රු. 1,500 කි.

iv. විකුණුම් වට්ටනාකම රු. 100,000 කි.

v. විකුණුම් පිරිවැය රු. 65,000 කි.

vi. ව්‍යාපාරය ලද අමතර ආදායම රු. 36,000 කි.

vii. ගොඩනැගිලි කුලිය රු. 36,000 කි.

viii. රක්ෂණ ගාස්තු රු. 50,000 කි.

ix. කාර්යාල වියදම් රු. 14,000 කි.

x. සේවක වැටුප රු. 100,000 කි.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

## ප්‍රශ්ණ අංක 02

අ. ශාඛාවක් යනු කුමක්ද ? ශාඛාවක් සහ දෙපාර්තමේන්තුවක් අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ආ. "යැපෙන ශාඛා" සහ "ස්වාධීන ශාඛා " යන යෙදුම් දෙක පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ඇ. ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවේ ගිණුම් පොත්වල පහත ගනුදෙනු සටහන් කරන්න.

i. ශාඛාවට යවන ලද / ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ රු. 925,000
ii. ඉහත භාණ්ඩ වලින් රු. 24,000 ක් වටිනා භාණ්ඩ ශාඛාව මගින් ප්‍රධාන කාර්යාලය වෙත ආපසු යැවුණි.
iii. ශාඛාව මගින් සිදුකරන ලද ශාඛා වියදම් රු. 61,000
iv. ප්‍රධාන කාර්යාලය විසින් ගෙවන ලද ශාඛා ගොඩනැගිලි කුලිය රු. 72,000
v. ශාඛාව විසින් බාහිර පාර්ශවයකින් රු. 786,000 ක් වටිනා භාණ්ඩ ණයට මිලදීගෙන ඇත.
vi. ශාඛා අලෙවිය රු. 4,825,000 (ණය පදනම මත)
vii. ශාඛා ණයගැතියන් ඔවුන්ගේ ගෙවීම් ප්‍රධාන කාර්යාලය වෙත ගෙවන ලදී. රු. 589,000
viii. ශාඛාවේ මිලදී ගැනීම් සඳහා ප්‍රධාන කාර්යාලය විසින් රු. 121,000 ක් ගෙවන ලදී.
ix. ශාඛාව මගින් මිලදීගත් උපකරණ රු. 1,220,000 කි.
x. ඔවුන්ගේ භාවිතය සඳහා ශාඛාව රු. 1,000,000 ක් වටිනා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලදී. කෙසේවෙතත්, එම ගෘහභාන්ඩ ගිණුම ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබයි.

(ලකුණු 20)
(මුළු ලකුණු 25)

## ප්‍රශ්ණ අංක 03

අ. පහත දැක්වෙන්නේ 2020 මාර්තු 31 දිනට චේතනා සහ අභිත ව්‍යාපාරයේ ශේෂ පත්‍රයයි.

| වගකීම් | රු. | වත්කම් | රු. |
|---|---|---|---|
| සංචිත අරමුදල | | ගොඩනැගිලි | 105,000 |
| - චේතනා | 30,000 | කීර්තිනාමය | 31,000 |
| - අභිත | 30,000 | ආයෝජන | 48,000 |
| ආයෝජන උච්ඡාවචන අරමුදල | 11,000 | ණයගැති වෙන්කිරීම් (55,000 - 5,000) | 50,000 |
| ණය - චේතනා | 36,000 | තොගය | 21,000 |
| - අභිත | 55,000 | බැංකු මුදල් | 45,000 |
| ණයහිමියෝ | 138,000 | | |
| එකතුව | 300,000 | එකතුව | 300,000 |

2020 මාර්තු 31 දින සමාගම විසුරුවාහරින ලද අතර, එදින පහත ගනුදෙනු සිදුවිය.

i. චේතනා ගේ සම්පූර්ණ ණය මුදල පියවා ගැනීම සඳහා ඇය විසින් රු. 15,000 ක් වටිනා භාණ්ඩ තොගයක් රැගෙන යන ලදී.

ii. අභීත විසින් 12% කට අඩු මුදලකට ආයෝජන වලින් අඩක් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියන් රු. 47,000 කට උපලබ්ධි විය.

iv. ණයහිමියන් රු. 1,000 ක මුදලක් අඩුවෙන් පියවන ලදී.

v. ගොඩනැගිලි රු. 150,000 ක මුදලකට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු. 35,000 ක මුදලකට උපලබ්ධි විය.

vii. ඉතිරි ආයෝජනය රු. 20,000 කට අලෙවි කරන ලදී.

viii. පොත්වල සටහන් නොවූ පැරණි පරිගණකයක් අභීත විසින් රු. 15,000 කට පවරා ගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු. 13,000

අවශ්‍ය වන්නේ,

1. උපලබ්ධි ගිණුම
2. අයිතිකරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
3. බැංකු ගිණුම.

(ලකුණු 15)

ආ. පහත යෙදුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. ව්‍යාපාරයක සුන්බුන් වටිනාකම

ii. ගැලපුම් සංකල්පය

iii. ගිණුම්කරණ ඒකක සංකල්පය

iv. ගිණුම්කරණ පරිසරය

v. වෙනත් විස්තීරණ ආදායම්

(ලකුණු 2x5 =10)
(මුළු ලකුණු 25)

ප්‍රශ්ණ අංක 04

ප්‍රින්ස්ටන් (පුද්ගලික) සමාගම සහ රෙනෝල්ඩ් (පුද්ගලික) සමාගම ඔවුන්ගේ ව්‍යාපාර ඒකාබද්ධ කිරීමට එකඟ විය. 2019 දෙසැම්බර් 31 වන දිනට ඔවුන්ගේ මූල්‍ය තත්වයන් පහත පරිදි වේ.

| වත්කම් | ප්‍රින්ස්ටන් | රෙනෝල්ඩ් | වගකීම් | ප්‍රින්ස්ටන් | රෙනෝල්ඩ් |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 250,000 | 150,000 | කාර්යාල ගොඩනැගිලි | 78,000 | - |
| සමාන්‍ය සංචිත | 62,000 | 6,000 | ගෘහ භාණ්ඩ | 10,000 | 13,000 |
| ණයහිමියෝ | 104,000 | 52,000 | ණයගැතියෝ | 130,000 | 104,000 |
| | | | තොගය | 42,000 | 26,000 |
| | | | බැංකු | 156,000 | 65,000 |
| එකතුව | 416,000 | 208,000 | එකතුව | 416,000 | 208,000 |

i. සමාගම් දෙකෙහිම ණයහිමියන් සහ ණයගැතියන් නව ඒකාබද්ධ සමාගම වන "ප්‍රි - නෝල්ඩ් (පුද්ගලික) සමාගම " විසින් පවරාගනු නොලැබීය.

ii. කාර්යාල ගොඩනැගිල්ල ප්‍රින්ස්ටන්හි අයිතිකරු විසින් පවරාගන්නා ලදී.

iii. ප්‍රින්ස්ටන් සහ රෙනෝල්ඩ් විසින් කීර්තිනාමය සඳහා පිළිවෙලින් රු. 40,000 කින් සහ රු. 20,000 කින් දායක විය.

අවශ්‍ය වන්නේ,

අ. ප්‍රින්ස්ටන් (පුද්ගලික) සමාගමේ පොත් වසා දැමීමට ලෙජර් ගිණුම් සකස් කරන්න.

(ලකුණු 10)

ආ. රෙනෝල්ඩ් (පුද්ගලික) සමාගමේ පොත් වසා දැමීමට ලෙජර් ගිණුම් සකස් කරන්න.

(ලකුණු 10)

ඇ. නව සමාගම වන "ප්‍රි - නෝල්ඩ් (පුද්ගලික) සමාගමේ " පොත් වල ශේෂ පත්‍රය සකස් කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 25)